# ගම්පහ අධ්‍යාපන කලාපය
## අ.පො.ස. (සා/පෙළ) ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන - 2020
## සිංහල භාෂාව හා සාහිත්‍යය III

**කාලය පැය 02 යි.** | **11 ශ්‍රේණිය**

- ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න
- 1,2,3,4 ප්‍රශ්න වලටත් 5,6,7 ප්‍රශ්න වලින් එකකටත් උත්තර සපයන්න.

(1) (i) සිට (x) තෙක් ඇති සියලුම අනු කොටස් වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. (අ) සැළලිහිණි සංදේශයේ දූත කාව්‍ය ලියවී ඇති විරිත කුමක්ද?
(ආ) මෙම කාව්‍ය ලිවීමේ අරමුණ වූයේ කුමක්ද?

ii. (අ) හෙණයක් සේ පතිත වූ අහසින්
හිස මත දෙදරුම් දී
මෙහි දැක්වෙන උපමාවෙන් කියවෙන සිදුවීම කුමක්ද?
(ආ) සිංහබාහු නාට්‍ය රචකයාගේ ස්වයං ලිඛිත චරිතාපදානය කුමක්ද?

iii. ජාතිය රන් විමනක් වේ
ආගම මිණි පහණක් වේ
(අ) ඉතිරි දෙපද සම්පූර්ණ කරන්න.
(ආ) ඉහත කවියේ දැක්වෙන කාව්‍ය උපක්‍රමය කුමක්ද?

iv. "නිරිත දිග තද සුළඟට ඇඹරී ඇටුවන් බැහී ගිය ගහක් මෙන්"
(අ) මෙලෙස හඳුන්වන චරිතය කුමක්ද?
(ආ) ඇයගේ ශරීර ස්වභාවය කතුවරයා දැක්වූ තවත් ආකාරයක් ලියන්න.

v. (අ) "<u>තඹර පෙති අතර හෙල්මැලි</u> රේණු වැසි වසින" ඉරි ඇඳි පදවල අරුත් ලියන්න.
(ආ) වස්සානය පද්‍ය පන්තියෙහි රචකයා කවුද?

vi. "පෙරේතයො කෑම කන්නේ නෑ" කෑමට දිෂ්ටිය හෙළනවා
(අ) මෙය උපුටා ගත් පාඩම කුමක්ද?
(ආ) එහි රචකයා කවුද?

vii. කටු ඇල්ලේ මහ හේනේ කුරක්කන්
වැට අහුරා ඌරන්ගෙන් වළක්කන්
....................................................
....................................................
(අ)ඉතිරි දෙපද සම්පූර්ණ කරන්න.
(ආ) කුරහන් කවි කුමන කවි ප්‍රවර්ගයට අයත් ද?

viii. "උග්ගසේන සිටු පුත්හුගේ වස්තුව" පාඩමෙහි
(අ) කතුවරයා
(ආ) පාඩම උපුටා ගත් පොත සඳහන් කරන්න.

ix. පහත දැක්වෙන කෘතිවල රචකයා නම් කරන්න.
(අ) මේඝදූතය
(ආ) හංස සන්දේශය

x. "ඔහු වියපත් කල්හි මවුපියෝ ශිල්ප උගන්නට තක්සලා නුවර නඟා යවුහ. හෙ ධර්මාන්තේවාසිකවැ ශිල්ප උගන්නී වත්සපනැ කී කී දැයක් වහා සපයයි"
(අ) මෙහි ඔහු යනුවෙන් හඳුන්වන්නේ කවුද?
(ආ) ඔහුගේ චරිත ලක්ෂණ 02 ක් ලියන්න.

(2) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්න වලට කෙටි උත්තර ලියන්න.

i. තුමුල ගතින් දා
බාහු බෙලෙන්දා
වෙමි සේ තිදසින් දා
කුරිරු ගිජින්දා
කඹු තල සින්දා
ලම් සේ කෙසරින්දා
(අ) ඉරි ඇඳි පදවල අරුත් ලියන්න.
(ආ) ඉහත කොටසේ අර්ථය සරලව ලියන්න.

ii. මිනිසුන් ඉවුරුවල යන එන අඩි සද්දෙ න්
ළය යට සසල බව මින් මතු නොනැඟෙද්දෙන්
කෙකටිය ඕලු නළියන දියරැළි මැද්දෙ න්
මල් පෙති වියළි කොළ එන අතකට එද්දෙ න්

(අ) පළමු දෙපදය තුළින් කවියා දෙන ව්‍යංග්‍යාර්ථය කුමක්ද?
(ආ) "මල් පෙති" "වියළි කොළ" යන්නෙන් කවියා අදහස් කරන දෑ කෙටියෙන් පැහැදිලි කරන්න.

iii. යමුගුරු බා ලා සියලු රා මස් පිරූ සැළවල් බිඳ තූ තූ කොට පියා......
(අ) මෙහි දැක්වෙන රචනා උපක්‍රමයක් නම් කරන්න.භාෂාව රසවත් කිරීමට මෙහි යොදා ගෙන ඇති උපක්‍රමය කුමක්ද?
(ආ) මෙම ගද්‍ය කොටස දැක්වෙන අවස්ථාව කෙටියෙන් ලියා දක්වන්න.

iv. අසන රිසින් නයි කැල ඔසළෝයා
ඔවුන වෙත ම සිටිනා ගුරුළෝයා
....................................................
....................................................
(අ) ඉහත කවි දෙපදය සම්පූර්ණ කරන්න.
(ආ) "රිසින්" "ඔසළෝයා"යන පදවල අරුත් ලියන්න.

v. ''එහෙත් මකරා නිදා ගන්නා විනා මිය ගියේ නැත. අනිත් අය නින්දට ගිය අතර උඹ යළිත් නැගිට ගමපුරා සැරිසරන්නට විය''
(අ) මෙම ගද්‍ය කොටස අයත් කෙටිකතාව ලියූ රචකයා විසින් රචිත නව කතා දෙකක් නම් කරන්න.
(ආ) ඉහත ප්‍රකාශයට අදාල අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ලකුණු 20)

(3) (අ) $(i)$ තාත්වික චරිත නිරූපණය
$(ii)$ තාරුණ්‍යයේ අභිමානවත් බව
යථාර්ථවාදීව එළිදැක්වෙන නාට්‍යයක් ලෙස සිංහබාහු නාට්‍ය පෙළ පිළිබඳ විමසන්න.

නැතහොත්

වීදාගමහිමියෝ
(අ) අතිශයෝක්තියත්
(ආ) ස්වභාවෝක්තිය
ප්‍රියකළ කවියෙකි. නිර්දිෂ්ට පැදිපෙළ ඇසුරින් උදාහරණ 04 ක් දක්වමින් විමසන්න.

(4) i) පැරණි කාව්‍ය භාෂාව
ii) ව්‍යංග්‍යාර්ථවත් යෙදුම් භාවිතයත් කෙරෙහි දක්වන ප්‍රතිභාව නිසා ''ගංගාවේ සංගීතය'' පද්‍ය පන්තියේ රසවත් බව වැඩිවී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15)

- 5, 6, 7 ප්‍රශ්න වලින් එකකට පිළිතුරු සපයන්න.

(5) ''සිරි රහල් හිමියෝ අර්ථ රසය හා ,ශබ්ද රසය මනාව සංකලනය කරමින් අපූරු කාව්‍යෝත්ති නිමවති. මඟ විසිතුරු පාඩම ඇසුරින් උදාහරණ තුනක් දක්වමින් පැහැදිලි කරන්න.

(6) "විරිත් භාවිතය, එළිසමය හා උපමා භාවිතයේ දක්ෂතාවය වෑත්තෑවේ හිමියන්ගේ ප්‍රතිභාපූර්ණ කවීත්වය විදහාපන කැඩපතයි."
උදාහරණ ගෙන පැහැදිලි කරන්න.

(7) සරලත්වය, සංක්ෂිප්තභාවය හා ධ්වනිතාර්ථවත් පද භාවිතය ද කුරහන් කවි සාර්ථක වීමට හේතුවකි. නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.